# එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධන ඉලක්කවල සමකාලීන අවශ්‍යතාව විශ්ලේෂණය කිරීම: ශ්‍රී ලංකාව ආශ්‍රයෙන්

ආර්.එම්.සී.ඩී. රත්නායක- ජාත්‍යන්තර සබඳතා අධ්‍යයනාංශය

සංවර්ධනය යන්න ජාතික අවශ්‍යතාවක් ලෙස ගොඩනැගෙන කාල වකවානුවක සංවර්ධනය වෙමින් පවතින රටක් වශයෙන් ශ්‍රී ලංකාව එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන වැඩසටහන කරා ප්‍රවේශ වී ඇත. ප්‍රධාන ඉලක්ක 17ක් සහ අරමුණු 169ක් මුල්කරගත් සංවර්ධන න්‍යාය පත්‍රයක් වශයෙන් ලෝකයට හඳුන්වා දුන් මෙය 2015 සිට 2030 දක්වා කාලය තුළ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වේ. තිරසර සංවර්ධනයේ සමකාලීන අවශ්‍යතාව යන තේමාව මත සිද්ධි අධ්‍යයනයක් ලෙස යොදා ගනිමින් මෙම පර්යේෂණය සිදු කෙරුණි. අර්ධව්‍යුහගත සම්මුඛ සාකච්ඡා උපයෝගී කර ගනිමින් තිරසර සංවර්ධනය ක්‍රියාත්මක කිරීමේ ප්‍රවේශය හා ඒ මගින් ලැබෙන ප්‍රතිලාභ අධ්‍යයනයට බඳුන් කර ඇත. ජාතික වශයෙන් මෙහි ක්‍රියාකාරිත්වය තුළ පවතින අභියෝග අධ්‍යයනයට ලක් කිරීමෙන් ඒවා කළමනාකරණය කිරීමේ ක්‍රියාවලිය කෙරෙහි අවධානය යොමු කිරීමක්ද සිදු කර ඇත. තිරසර සංවර්ධන දැක්මට සියලු දෙනා අන්තර්ගත වන ප්‍රවේශයක් මගින් මානව ආරක්ෂාව හා ජාත්‍යන්තර සහයෝගීත්වය ස්ථාපනය කිරීම වැදගත් වේ. පුද්ගල කේන්ද්‍රීය වූ මානව ආරක්ෂාව යන්න සහජීවනය කෙරෙහි විතැන්වීමෙන් සංවර්ධනයේ තිරසාරත්වය වර්ධනය වන බව අධ්‍යයනය මගින් තහවුරු වේ. එමෙන්ම තිරසර සංවර්ධනය උදෙසා ජාත්‍යන්තර, පෞද්ගලික, සිවිල් සමාජ, සහයෝගයන්හි අවශ්‍යතාවද අධ්‍යයනයට ලක්ව ඇත. ශ්‍රී ලංකාව තුළ ඉලක්කගත පදනමෙන් මිදී ජාතික වශයෙන් දේශීයකරණය කළ ප්‍රතිපත්ති මගින් තිරසර බව ඇති කිරීමේ මූලික වගකීම රාජ්‍ය සතුව පවති. මේ වන විට ශ්‍රී ලංකාව ඒ සඳහා ආයතනික රාමුව ගොඩනගා ඇති නමුත් එහි ක්‍රියාකාරිත්වයේ හා විනිවිදභාවයේ ගැටලු පවතී. ඒ අනුව නිසි ප්‍රතිලාභ ලබාගැනීමට නම් නිසි අධීක්ෂණ රාමුවක් හා ප්‍රාදේශීය මට්ටම දක්වා ව්‍යාප්ත වූ වැඩපිළිවෙළක් අවශ්‍ය වේ. ඒ අනුව ජාතික තලයේ අභියෝග කළමනාකරණය මගින් ක්‍රියාකාරී මැදිහත්වීමක් රාජ්‍යය සිදු කළ යුතු ය. නිසි දැක්මක් හා ඉලක්ක මත පිහිටා සංවර්ධන ප්‍රවේශයක් ඇති කිරීම කෙරෙහි ශ්‍රී ලංකාවේ අවධානය යොමු වීමේ අවශ්‍යතාවක් පවතී. ඒ අනුව සමාජ සංවර්ධනය, ආර්ථික සංවර්ධනය, පාරිසරික ආරක්ෂණය යන පැතිකඩ තුනේ සමතුලිතභාවයක් සහිතව ශ්‍රී ලංකාවට තිරසර සංවර්ධන මාවතකට ප්‍රවේශය ගොඩනගා ගතහැකි බව පර්යේෂණානුකූලව පෙන්වා දිය හැකිය.

***ප්‍රමුඛ පද:*** *තිරසාරත්වය, ජාත්‍යන්තර සහයෝගීත්වය, සහජීවනය ,මානව ආරක්ෂාව*